(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

අංක **37.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2024 ජූලි 12 සිකුරාදා පූ.භා. 9.30** ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

---

ගරු **ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** කර්මාන්ත අමාත්‍යතුමා සහ සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය සහ වාරිමාර්ග අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රෝහණ දිසානායක මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු නීතිඥ උදයන කිරිඳිගොඩ මහතා

ගරු කේ. එස්. කුගදාසන් මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු සු. නෝගරාදලිංගම් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ධම්මික පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජගත් ප්‍රියංකර මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු නීතිඥ එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු නීතිඥ මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම**: (1) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් —

(i) (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වගන්තිය සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජනවාරි 12 දිනැති අංක 2366/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය

(අංක 02/2024 දරන සුරාබදු නිවේදනය); සහ

(ii) 2024 වර්ෂය සඳහා මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

ඉදිරිපත් කර, එම නිවේදනය සහ වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ තායිලන්ත රාජධානිය අතර නිදහස් වෙළඳ ගිවිසුම සහ එම ගිවිසුම පිළිබඳ තොරතුරු ඇතුළත් සංක්ෂිප්ත ග්‍රන්ථය ඉදිරිපත් කරන ලදී.

එම ලිපිලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(4) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් (81 අධිකාරය වූ) ණය සහනදායක ආඥාපනතේ 63 වගන්තිය සමඟ කියවිය යුතු 6 සහ 10 වගන්ති යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 අප්‍රේල් 22 දිනැති අංක 2381/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කර, එම නියෝග අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ජාතික බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. කාරක සභා වාර්තා පිළිගැන්වීම**: (1) යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා විසින් යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද ශ්‍රී ලංකා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ ආයතන සමූහය අතර මාර්ගගත ආකාරයෙන් වීසා සහ විදෙස් ගමන් බලපත්‍ර අයදුම් කිරීමේ සේවා බැහැරින් ලබා ගැනීම පිළිබඳ වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) මැල්සිරිපුර, අඹන්පොල යන ලිපිනයෙහි පදිංචි ඒ. යූ. මධුර විජයපාල මහතාගෙන් ලැබුණු 2024.06.11 දිනැති පෙත්සම; සහ

(ii) ගලගෙදර, උණුපතයාය, අංක 185 - බී දරන ස්ථානයෙහි පදිංචි ජී.ඒ. සුභද්‍රා මහත්මියගෙන් ලැබුණු 2024.06.09 දිනැති පෙත්සම

ගරු ජේ. සී. අලවතුවල මහතා විසින් පිළිගන්වන ලදී.

(2) බත්තරමුල්ල, පන්නිපිටිය පාර, දර්ශන මාවත, අංක 139/13, (1011) දරන ස්ථානයෙහි පදිංචි එම්. ඒ. කෞෂාල් මෙන්ඩිස් මහතාගෙන් ලැබුණු 2024.05.02 දිනැති පෙත්සම ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. පාර්ලිමේන්තුව් වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 2, 3, 4, 5 සහ 6 පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 24(2) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි අධ්‍යාපන අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ.භා. 10.28ට ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.)

**5. ක්‍රීඩා අමාත්‍යාංශයේ විගණන සහ නීති අංශ ශක්තිමත් කිරීමට වැඩසටහනක් සකස් කිරීම:** ගරු රෝහණ බංඩාර මහතා ගරු හේෂා විතානගේ මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ඇතුළු ක්‍රීඩා සංගම් රැසක් අතිශය දූෂිත තත්ත්වයට පත් වී ඇති හෙයින් එම තත්ත්වය මැඩපැවැත්වීම සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයේ විගණන හා නීති අංශ ශක්තිමත් කිරීමට රජය විසින් වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(පා.40/2024)

"ගරු නීතිඥ මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ.භා. 10.40ට ගරු නීතිඥ මධුර විතානගේ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ.භා. 11.00ට ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.)

‘‘ගරු  කිංස් නෙල්සන් මහතා මූලාසනාරූඪ විය යුතු ය’’යි , බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ.භා. 11.47ට ගරු  කිංස් නෙල්සන් මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. ආගමික අන්තවාදය වැළැක්වීමේ අවශ්‍යතාවය:** ගරු හේෂා විතානගේ මහතා ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— කවර රටක කවර ක්ෂේත්‍රයක වුව ද අන්තවාදී අදහස් තිබීම ඉතා හානිකර වන හෙයින් ද, ආගමික අන්තවාදය පිළිබඳව පසුගිය පාස්කු ප්‍රහාරයෙන් පසුව සමාජයේ විශාල කතිකාවතක් ඇති වී තිබෙන හෙයින් ද, ආගමික අන්තවාදය මතුවීම හා ප්‍රවර්ධනය කිරීම වැළැක්වීම සහ එයට දැනටමත් ගොදුරු වී සිටින පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(පා.10/2024)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී සිසු සිසුවියන් ලබා ගන්නා Z- අගය (Z- Score) මත සියලුම රාජ්‍ය අංශයේ රැකියා පුරප්පාඩු පිරවීම:** ගරු ඩලස් අලහප්පෙරුම මහතා ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව**,—** රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ දී පැවති හා පවත්නා ආණ්ඩු විසින් දේශපාලන පක්ෂපාතීත්වය මත හෝ රුචි අරුචිකම් මත අනුගමනය කරන ලද ප්‍රතිපත්ති රාජ්‍ය සේවයේ ස්වාධීනත්වයට බරපතල හානියක් සිදු කර ඇති හෙයින් ද, ඒ හේතුවෙන් දැඩි දේශපාලනීකරණයට ගොදුරු වී ඇති රාජ්‍ය සේවය මුළුමනින්ම ස්වාධීන කර ගැනීමට අවශ්‍ය වන හෙයින් ද, අධ්‍යාපන සුදුසුකම් මත පමණක් රැකියා ලබා දීමේදී දක්ෂ හා සුදුසුකම් සහිත දරුවන්ට යුක්තිය හා සාධාරණත්වය ඉටුවන බැවින් තරුණ අසහනය මුලිනුපුටා දැමීමට ඉන් හැකිවන හෙයින් ද, දිස්ත්‍රික්කය තුළ ඇතිවන පුරප්පාඩු අදාළ දිස්ත්‍රික්කය තුළ පදිංචිකරුවන්ට හිමිවීම හරහා රැකියාලාභීන්ගේ ආර්ථික සුරක්ෂිතතාව මෙන්ම ඉහළ කාර්යක්ෂම සේවාවක් රාජ්‍ය අංශයට ලබා ගැනීමට අවකාශ උදාවන හෙයින් ද, සියලුම රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා, අධිකාරී, මණ්ඩල සහ පළාත් සභා අනුබද්ධ සියලු ආයතනයන් හි රැකියා පුරප්පාඩු පිරවීම සඳහා අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී සිසු සිසුවියන් ලබා ගන්නා Z- අගය සැලකිල්ලට ගැනීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(පා.18/2024)

‘‘ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය යුතු ය’’යි අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.10ට ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.)

‘‘ගරු නීතිඥ උදයන කිරිඳිගොඩ මහතා මූලාසනාරූඪ විය යුතු ය’’යි ගරු ඩලස් අලහප්පෙරුම මහතා, ගරු මුජිබුර් රහුමාන් මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.25ට ගරු නීතිඥ උදයන කිරිඳිගොඩ මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. කඳුරට වෘත්තීය සමිති විරු දිනය ප්‍රකාශයට පත්කිරීම**: ගරු වේලු කුමාර් මහතා ගරු වී. රාධක්‍රිෂ්ණන් මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— කඳුරට වතුකර කම්කරුවන් ශ්‍රී ලාංකීය ඉතිහාසය තුළ එහි ආර්ථිකය වෙනුවෙන් සුවිශාල දායකත්වයක් ලබාදුන් ප්‍රජාවක් වන හෙයින් ද, ප්‍රජාතන්ත්‍රවාදී අරගල ඔස්සේ තම අයිතිවාසිකම් දිනා ගනිමින් එම අරගලයන් හි දී සිය ජීවිත පූජා කළ වෘත්තීය සමිති විරුවන් එක් පොදු දිනක දී සිහිපත් කිරීම මෙරට ජීවත්වන ඉන්දීය සම්භවයක් සහිත කඳුරට ජනතාවගේ දීර්ඝ කාලීන ඉල්ලීමක් වන හෙයින් ද, 1939 දෙසැම්බර් සිට 1940 ජනවාරි දක්වා ශ්‍රී ලංකාවේ කඳුරට කම්කරු ප්‍රජාව විසින් වැටුප් වැඩි කරන මෙන් ඉල්ලා සිදු කරන ලද ප්‍රථම වෘත්තීය සමිති අරගලයේ දී සුදු ජාතිකයෙකු විසින් සිදුකරන ලද වෙඩි තැබීමකින් ''මුල්ලෝයා ගෝවින්දන්'' නමැති කම්කරුවා ජීවිතක්ෂයට පත් වූ හෙයින් ද, කඳුරට කම්කරු ප්‍රජාව විසින් සිදුකරන ලද අවිහිංසාවාදී අරගලයේ දී ජීවිතය පූජා කළ එම පළමු කම්කරුවා සහ ඉන් අනතුරුව කඳුරට කම්කරු ජනතා අයිතිවාසිකම් සහ සුභසාධනය සඳහා දියත් කෙරුණු බොහෝ වෘත්තීය සමිති අරගලයන් හි දී ජීවිත පූජා කළ අනෙකුත් විරුවන් සැමරීම සඳහා එම පළමු වෘත්තීය සමිති විරුවා මියගිය දිනය වන ජනවාරි 10 දින කඳුරට වෘත්තීය සමිති විරු දිනය ලෙස ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(පා.37/2024)

''ගරු ඩී. වීරසිංහ මහතා මූලාසනාරූඪ විය යුතු ය''යි ගරු බුද්ධික පතිරණ මහතා, ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.09ට ගරු ඩී. වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. ආක්‍රමණශීලී පැළෑටි හා සතුන් හේතුවෙන් ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම:** ගරු බුද්ධික පතිරණ මහතා ගරු වීරසුමන වීරසිංහ මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හානි විය හැකි ආක්‍රමණශීලී පැළෑටි හා සතුන් හඳුනාගෙන, ඒවා නම් කිරීම මඟින් එම පැළෑටි හා සතුන් බෝ කිරීම හා ආනයනය කිරීම තහනම් කර ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට රජය මැදිහත් වී කඩිනමින් අවශ්‍ය නීති සම්පාදනය කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(පා.1/2024)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. කල් තැබීම:** ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය''යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 3.03ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් පාර්ලිමේන්තුව, 2024 ජූලි 23 අඟහරුවාදා පූ.භා. 9.30 වනතෙක් කල් තබන ලදී.